# ශ්‍රී ලාංකේය සමාජයේ චාරිත්‍ර

GENC-1001.2

ශ්‍රී ලාංකේය සමාජය හා බෞද්ධ සංස්කෘතිය


පූජ්‍ය කුඩාකත්නෝරුවේ විනීත හිමි

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ශ්‍රී ලාංකේය සමාජය සහ බෞද්ධ සංස්කෘතිය

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

# අරමුණු

- චාරිත්‍ර පිළිබඳ මූලික අවබෝධය ලබාදීම
- ශ්‍රී ලාංකේය සමාජයේ මූලික චාරිත්‍ර හඳුනාගැනීම
- ශ්‍රී ලාකේය බහුසංස්කෘතික පසුබිමෙහි චාරිත්‍ර හඳුනාගැනීම
- බහුසංස්කෘතික පදනමක සංස්කෘතිකම්

# ශ්‍රී ලාංකේය සමාජය හැඳින්වීම

- ප්‍රාග් බෞද්ධ ශ්‍රී ලාංකේය සමාජය සමාජය යක්ෂ (වැද්දන්), නාග (මණියක්කිත), දේව (සුමනසමන්) සහ රාක්ෂ (රාවණ) වශයෙන් හඳුනාගත් 'සිව්හෙළ' යෙන් මන්විත වීයි ඒ ඒ ගොත්‍ර නිදර්ශන පිළිබඳ මතවාද පවතී.
- සිංහල ප්‍රජාව ඉන්දීය ආර්ය වංශික විජයගෙන් පැවත එයි. - බෞද්ධ, කතෝලික හා ක්‍රිස්තියාණි
- දෙමළ ප්‍රජාව දකුණු ඉන්දීය දෙමළ ජනයා සමග සම්බන්ධ වේ. (ලංකා/ඉන්දීය) - හින්දු, ක්‍රිස්තියාණි හා බෞද්ධ
- මුස්ලිම් ජනයා වෙළෙන්දන් ලෙස ඉන්දියාවෙන් මෙරටට පැමිණ තිබේ. - ඉස්ලාම්
- අධිරාජ්‍යවාදී ආක්‍රමණ මගින් කතෝලික හා ක්‍රිස්තියාණි ආගම් හඳුන්වාදී තිබේ.
- චීන, මැලේ, බර්ගර් හා ශ්‍රී ලංකා අප්‍රිකානු වශයෙන් ද සුළු ජනකණ්ඩායම් වේ.

- ශ්‍රී ලංකාවේ බහුතරය සිංහල බෞද්ධ වේ. නමුත් වර්තමාන ශ්‍රී ලාංකේය සමාජය බහුවාර්ගික, බහුආගමික සහ බහුභාෂික ය. එනිසා ශ්‍රී ලාංකේය සමාජය බහුවිධ සංස්කෘතික පසුබිමක් සහිත සමාජයකි.
- වෙනත් ජනසමාජවල මෙන්ම ශ්‍රී ලාංකේය සමාජයේ ද චාරිත්‍ර-වාරිත්‍ර හා අභිචාර ඈත අතීතයකට හිමිකම් කියයි. එම චාරිත්‍ර මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයේ සමාජ-ආගමික කාරණාවන් සමග සම්බන්ධවී තිබේ
- කවරම සමාජයක වුවත් චාරිත්‍ර සමාජ හා පුද්ගල ජීවිතය සමග සෘජුව හෝ වක්‍රව සම්බන්ධවී තිබේ. එහෙයින් බහු වාර්ගික සමාජයක චාරිත්‍ර හා අනන්‍යතාවන් හඳුනාගැනීම පහසු නොවේ.

# චාරිත්‍ර

- චාරිත්‍ර යනු පොදුවේ යම් ජනසමජයක් විසින් දීර්ඝ කාලයක් පුරා කරගෙන එන ලද දේවල් ය.
- සාම්ප්‍රදායිකව යම් ජන සමාජයකට, ස්ථානයකට හෝ කාලයකට විශේෂ කොට  ඉතා විශාල ලෙස පිළිගත් යම් ක්‍රියාකාරකමක් හෝ විශ්වාසයක් චාරිත්‍රයක් වේ
- චාරිත්‍රයක් යනු නිරන්තරයෙන්ම එය අයත් ජනසමාජය විසින් ධනාත්මක ලෙස පිළිගත් ක්‍රියාවක් වේ. එමෙන්ම තත් ජනසමාජය විසින් චාරිත්‍රවලට සාපේක්ෂව සෘණාත්මක ලෙස සලකා ප්‍රතික්ෂේප කරන ලද සියලු විශ්වාස, ක්‍රියාකාරකම් ආදිය වාරිත්‍ර නම් වේ. ඒ අනුව පිළිගත් චරියාධර්ම චාරිත්‍ර නම් වන අතර ප්‍රතික්ෂේපිත සියලු දේ වාරිත්‍ර නම් වේ.

# චාරිත්‍ර ආකාර

- පුද්ගලික චාරිත්‍ර - තනිව අනුගමනය කළ හැකි චාරිත්‍ර
- පොදු සමජ චාරිත්‍ර - සාමූහික වශයෙන් කෙරෙන චාරිත්‍ර
- පූජකයින් සම්බන්ධ වන චාරිත්‍ර - ආගමික පූජක දායකත්වයක් අවශ්‍යම චාරිත්‍ර
- පූජක හෝ පූජ්‍ය පක්ෂයට අයත් චාරිත්‍ර - ගිහි සාමාන්‍ය ප්‍රජාව සම්බන්ධ නොවන චාරිත්‍ර

# සාමාන්‍ය ජීවන චාරිත්‍ර

01. සුභපැතුම්

- සිංහල - 'ආයුබොවන්' (ආයු බොහෝ වේවා) ප්‍රතිචාරය ද එසේම වේ.
- දෙමළ - 'වනක්කම්' ප්‍රතිචාරය ද එසේම වේ.
- මුස්ලිම් - 'අස්සලාමු අලෛකුම්'

  ප්‍රතිචාරය - 'වලෛකුම් සලාම්'
- වර්තමානයේ බටහිර ආභාසයෙන් ජාති ආගම් හෝ සම්ප්‍රදාය භේදයකින් තොරව Good Morning යන්න ව්‍යවහාර කරයි.

# 02 වැඩිහිටියන්ට ගෞරව කිරීම

- වැඩිහිටියන්ට ගෞරව කිරීමේදී වයසින් අඩු අය වැඩිහිටියන් ඉදිරියට ගොස් දෙදන නමා හිස පහත් කොට දෙඅත් එකතු කර දෙපා වඳිනු ලබයි.
- වැඳුම් ලබන තැනැත්තා වඳින තැනැත්තාගේ හිස අත ගා 'යහපතක් වේවා', 'තෙරුවන් සරණයි' යනුවෙන් ආශිර්වාද කරයි.
- වැඩිහිටියන් සමග වාඩිවන විට සම අසුන් හෝ පහත අසුනක වයසින් බාල අය වාඩි වන අතර ඉහත අසුන්වල වාඩි නොවෙයි.
- සාමාන්‍යයෙන් දෙමාපියන්ට, වඩිහිටියන්ට හා පූජ්‍ය පක්ෂයට වන්දනා කරනු ලබයි.
- බොහෝ විට ඉහත චාරිත්‍රය බෞද්ධ හා හින්දු ආගමික සංස්කෘතිය තුළ ප්‍රකට අතර වෙනත් ආගමික සංස්කෘතීන් යම් වෙනස්කම් ඇතත් වැඩිහිටි ගෞරවය අගය කරයි.

# 03 ආගන්තුකයෙකු නිවසට පැමිණීම

- ආගන්තුක අයෙකු නිවසට පැමිණි කල්හි ගෘහාධිපති වශයෙන් පිළිගෙන අසුන්ගන්නා ලෙස ආරාධනා කරයි. තේ, කෝපි ආදී බීමවලින් සංග්‍රහ කරයි.
- අනතුරුව බුලත් විට ආදියෙන් සංග්‍රහ කරයි. එම දේවල් පිළිගන්වන විට සාමානයයෙන් 'ස්තූතියි' කියා නොකිය යි. සිනහවකින් හෝ 'පිං සිදු වේවා' යනුවෙන් ප්‍රතිචාර දක්වයි.
- වර්තමානයේ බොහෝ විට බටහිර ආභාසයෙන් අතට අත දීම හෝ සිතූතියි කීම කරනු ලබයි.
- වෙනත් ආගමික සංස්කෘති නියෝජනය කරන අය තමන්ගේ මූලික ආගමික හෝ පාරම්පරික චාරිත්‍ර අනුව පිලිගැනීම හා ප්‍රතිචාර දැක්වීම කරනු ලබයි.

# 04 ජ්‍යොතිෂය

- ශ්‍රී ලාංකේය සමාජයේ බොහෝ චාරිත්‍ර සඳහා පෙරදිග භාරතීය ආභාසය ලැබී තිබේ. එහිදී හින්දු හා බෞද්ධ ආගමික සංස්කෘතියට ජ්‍යොතිෂයේ විශේෂ බලපෑමක් දක්නට ලැබේ.
- පුද්ගලික ජීවිතයේ හෝ සමාජ ක්‍රියාකාරකම්වල දී ශුභ හෝරාවන් බැලීම චාරිත්‍රයකි. ජ්‍යොතිෂය මත පදනම්ව කාල හෝරාවන් තීරනය කෙරෙන අතර ‘රාහු කාලය’ මග හැර දවසේ කටයුතු ආරම්භ කිරීම බොහෝ දෙනාගේ චාරිත්‍රයකි.
- බොහෝ විට ලාංකේය සමාජයේ සියලු ආගමික සංස්කෘතික කණ්ඩායම් ජ්‍යොතිෂයට අදාළ ඇවතුම් පැවතුම් හෝ චාරිත්‍ර අනුගමනය කිරීම බහු සංස්කෘතික පරිසරයක ඇතිවන සම්මිශ්‍රණයට නිදසුනකි.

# 05 උත්සව ආරම්භය

- පොදු උත්සව ආරම්භ කිරීමේදී හේවිසි තූර්ය වාදනය කරයි. අනතුරුව කුකුළා සහිත පොල්තෙල් පහන් දැල්වීම චාරිත්‍රය කි. අනතුරුව පංච සීලය සමාදන්වීම හෝ යම් වේලාවකට තමන් අදහන ආගම මෙනෙහි කිරීම කරනු ලබයි.
- සාම්ප්‍රදායික පොල්තෙල් පහන මතුපිට කුකුළෙකු සංකේතවත් කෙරෙන අතර බෞද්ධ-හින්දු ආගමිකයින් එය යොදා ගත්තේය. වර්තමානයේ ඇතැමුන් තම ආගමික සංකේත ඒ වෙනුවට යොදා ගනී. බෞද්ධ - ධර්ම චක්‍රය, ක්‍රිස්තියාණි - කුරුසය, මුස්ලිම් - අඩසඳ හා තරුව යොදාගැනීම නිදසුන් වේ.
- පංච තූර්ය වාදනය ද ඒ ඒ ආගමික හා සංස්කෘතික පදනම අනුව එකිනෙකට වෙනස් අයුරින් යොදාගනු ලබයි.

# 06 කෘෂිකර්මාන්තය

- සාම්ප්‍රදායිකව කෘෂිකර්මාන්තයේ නියැලෙන ආදී මිනිසා එහිදී ද සිය පාරම්පරික අද්දැකීමට අමතරව කපුමහතාගේ හෝ ජ්‍යෝතිෂඥයාගේ උපදෙස් ගැනීම ද දක්නට ලැබුණි.
- කෘෂිකාර්මික කටයුතු සුභ හෝරාවක ආරම්භ කිරීම
- යොදාගත් දිනෙක සී සෑමේ මහෝත්සව මංගල්‍යයක් මගින් කෘෂිකාර්මික කටයුතු ආරම්භ කිරීම
- කපුරාලගේ මගපෙන්වීමෙන් 'අභිමාන දේවතා' නම් කෘෂි කර්මාන්තයට සම්බන්ධ ඉෂ්ටදේවතා බාර-හාරවීම. ඇස්වහ කටවහ දුරු කිරීම වැනි චාරිත්‍ර ඉෂ්ටසිද්ධ කළහි
- අලුත් සහල් මංගල්‍යය නමින් රාජකීය උත්සවයක් සංවිධානය කරන්නේ උපයාගත් අස්වැන්න බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ජය ශ්‍රී මහ බෝධිය ආදී පූජනීය ස්ථානවලට පිදීමෙනි. තවද ගෙදරට ගෙනා අස්වැන්නෙන් පරිභෝජනයට පෙර කිරි ආහාර සකස් කොට බුද්ධ පූජා පැවැත්වීම වැනි චාරිත්‍ර සුලභව සිදු වේ.

# තෑගි දීම

- වෙනත් ජන සංස්කෘති මෙන්ම ශ්‍රී ලාංකේය සමාජය දජීවිතයේ විශේෂ අවස්ථාවන් හිදී තෑගි දෙනු ලබයි. එහෙත් මල් කළඹක් පිළිගැන්වීම ඈත අතීයේ නොපැවැති අතර වර්තමානයේ එය බොහෝ සෙයින් සිදුවේ. මෙරට මිනිසුන් තමන්ට තිබෙන පරිහරණය කිරීමට සුදුසු භාණ්ඩ, දේපළ හා වස්තු තෑගි ලෙස හුවමාරු කරගෙන තිබේ.
- යම් තෑග්ගක් ආවරණය කොටදීමේදී එය පිළිගන්වන කෙනා ඉදිරිපිටදීම විවෘත කිරීම මෙරට සමාජ චාරිත්‍රයක් නොවේ. ලබාදුන් තැනැත්තා නික්ම ගිය පසුව විවෘත කරනු ලබයි.
- හින්දු පැරණි චාරිත්‍රය අනුව සත්ත්ව සම්වලින් කරන ලද භාණ්ඩ තෑගි ලෙස හුවමාරු කරගැනීමක් නොවුණි.